කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 01 WW/L/22/12/25/01
වර්ණය : රතු

# තද වැසි සහ තද සුළං පිළිබඳ අනතුරු ඇඟවීම

කාලගුණ විද්‍යා දෙපාතර්මේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූවර් අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2022 **දෙසැම්බර් මස** 26 වන දින පෙ.ව. 02.30 වන තෙක් වලංගු වන පරිදි
2022 **දෙසැම්බර් මස** 25 වන දින පෙ.ව. 02.30 ට නිකුත් කරන ලදී.

## දිවයින සඳහා

## සැලකිලිමත් වන්න!

**නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින පීඩන අවපාතය ත්‍රිකුණාමලය සිට කි.මී.160 නැගෙනහිරට බරව ඊසාන දෙසින් ස්ථානගතව ඇත. මෙම පද්ධතිය ඉදිරි පැය කිහිපය තුල නැගෙනහිර වෙරළ දෙසින් දිවයිනයට ඇතුල්වී ශ්‍රී ලංකාව හරහා ගමන් කරනු ඇත.**

## ගොඩබිම සඳහා:

මේ හේතුවෙන්, දිවයිනේ බොහෝ ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. ඇතැම් ස්ථාන වලට මි.මි. 150ට වැඩි තද වැසි ඇතිවිය හැක.

දිවයින හරහා විටින් විට හමන පැ.කි.මී. (40-50) ක පමණ තද සුළං ඇතිවිය හැක.







| | | |
|---|---|---|
| **වර්ණය: -රතු**<br>අනතුරු ඇඟවීම (පියවර ගන්න) | **වර්ණය: -ඇම්බර්**<br>අවවාදාත්මක (සූදානම් වන්න) | **වර්ණය: -කොළ**<br>(බලපෑමක් නැත) |

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## අනුගමනය කල යුතු ක්‍රියා මාර්ග:

- කඩාවැටෙන ගස්වලින් සහ විදුලි රැහැන් වලින් ආරක්ෂාවීම.
- ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.
- කාලගුණ විද්‍යා දෙපාතර්මේන්තුව විසින් ඉදිරි නිවේදන පිලිබඳ අවධානයෙන් සිටින්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.

## මුහුදු ප්‍රදේශ සඳහා:

### ශ්‍රී ලංකාව අවට මුහුදු ප්‍රදේශ සහ නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය සඳහා.

### සැලකිලිමත් වන්න!

මධ්‍යම බෙංගාල බොක්ක සහ නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ වල සහ ශ්‍රී ලංකාව අවට මුහුදු ප්‍රදේශ වල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (55-65) පමණ දක්වා වැඩි විය හැකි අතර වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

Advisory for Fishing and Naval Communities
issued at 02.30 a.m. on 25 December 2022, valid for next 24 hours




| වර්ණය: -රතු<br>අනතුරු ඇඟවීම (පියවර ගන්න) | වර්ණය: -ඇම්බර්<br>අවවාදාත්මක (සූදානම් වන්න) | වර්ණය: -කොළ<br>(බලපෑමක් නැත) |
|---|---|---|

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## අනුගමනය කල යුතු ක්‍රියා මාර්ග:

- මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකළපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල, නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ (06N - 14N, 78E – 85E) නැවත දැනුම්දෙන තෙක් යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.
- දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.
- කාලගුණ විද්‍යා දෙපාතර්මේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

| වර්ණය: -රතු<br>අනතුරු ඇඟවීම (පියවර ගන්න) | වර්ණය: -ඇම්බර්<br>අවවාදාත්මක (සූදානම් වන්න) | වර්ණය: -කොළ<br>(බලපෑමක් නැත) |
|---|---|---|